# POLITICAL IDEOLOGIES (Part V)

# ෆැසිස්ට්වාදය

ලිබරල්වාදය 17-18 සියවස්වලටත්, සමාජවාදය 19 වැනි සියවසටත්, ෆැසිස්ට්වාදය 20 සියවසේ පළමු අර්ධයටත් අයත් වූ මතවාද යි.

දෘෂ්ටිවාදයක් මෙන් ම, දේශපාලන ව්‍යාපාරයක් ද වශයෙන් ෆැසිස්ට්වාදය බිහි වූයේ පළමු හා දෙවන ලෝක යුද්ධ අතර කාලයේ ය.

දෙවන ලෝක යුද්ධයේ දී ඉතාලිය හා ජර්මනිය ලැබූ පරාජය සමඟ දේශපාලන මතවාදයක් ලෙස ෆැසිස්ට්වාදය තීරණාත්මක පරාජයකට භාජනය විය.

''ෆැසිස්ට් වාදය'' යන වචනය ඉතාලියේ බෙනීටෝ මුසෝලිනිගේ නායකත්වයෙන් බිහි වූ ඒකාධිපති, රණවාදී දේශපාලන ව්‍යාපාරය හැඳින්වීමට මුලින් ම භාවිත කෙරිණ.

ClassWork.LK

පසු ව එය ජර්මනිය සහ ජපානය තුළ බිහි වූ වර්ගවාදී, රණවාදී සහ ඒකාධිපතිවාදී දේශපාලන ව්‍යාපාර සහ රාජ්‍ය ක්‍රමය හැඳින්වීමට භාවිත කළ පොදු දේශපාලන නාමයක් බවට පත් විය.

ජර්මන් ෆැසිස්ට්වාදය හැඳින්වුණ ජර්මන් සම්භවයක් ඇති වචනය ''නට්සිවාදය'' (Nazism) යි. එය ''ජාතික සමාජ වාදය'' (National Socialism) යන අරුත් ඇති ජර්මන් වචනයේ සංක්ෂිප්තය යි.

ClassWork.LK

## පසුබිම

ඉතාලියේ සහ ජර්මනියේ ෆැසිස්ට්වාදය බිහි වූයේ ධනවාදය, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය, සමාජවාදය සහ කොමියුනිස්ට්වාදය යන මේවාට සම්පූර්ණයෙන් ම පසමිතුරු දෘෂ්ටිවාදයක් සහ දේශපාලන ව්‍යාපාරයක් ලෙසට ය.

පළමුවන ලෝක යුද්ධයේ පරාජය පසුබිම් කොටගෙන ඉතාලියේ සහ ජර්මනියේ ඇති වූ දැඩි දේශපාලන අර්බුදය, 1920 ගණන් වල ආර්ථික අවපාතය නිසා ඇති වූ ආර්ථික හා සමාජීමය කඩා වැටීම ෆැසිස්ට්වාදය හා නට්සිවාදය බිහි වීමේ පසුබිමෙහි තිබිණ.

ClassWork.LK

## මතවාදය

ෆැසිස්ට්වාදයේ මූලධර්ම සහ අරමුණු ඉතා පැහැදිලි ව ප්‍රකාශ කර තිබෙන්නේ ජර්මන් නට්සි පාලකයා වූ ඇඩොල්ෆ් හිට්ලර් (Adolph Hitler) 1925-26 දී ලියූ ''මගේ සටන'' (Mein Kampf) නම් කෘතියෙනි. එය දේශපාලන සිරකරුවකු ව සිටිය දී හිට්ලර් විසින් ලියන ලදද්කි.

හිට්ලර් සහ ඉතාලි ෆැසිස්ට්වාදී නායක බෙනිටෝ මුසොලිනී (Benitto Mussolini) ප්‍රකාශ කළ අදහස් හා භාවිත ආශ්‍රයෙන් ෆැසිස්ට්වාදී චින්තනයේ සහ දේශපාලනයේ ප්‍රධාන ලක්ෂණ හඳුනා ගත හැකි ය.

ClassWork.LK

## දේශපාලන ඒකබලවාදය (Totalitarianism)

ෆැසිස්ට්වාදය එක්තරා ආකාරයක ඒකාධිපති පාලන තන්ත්‍රයක් ගොඩ නැගීම ඉලක්ක කළ අතර, එය හැඳින්වීමට දේශපාලන න්‍යායයේ යොදා ගත් සංකල්පය ඒකබලවාදය යි.

එහි අර්ථය නම් රාජ්‍යය අත්‍යන්තයෙන් ම ඒකාධිපති වීම සහ ඒකාධිපති පාලන තන්ත්‍රයක් විසින් සමස්ත සමාජය මත්, දේශපාලන ක්‍රමයත් තම පරිපූර්ණ ග්‍රහණයට හා ආධිපත්‍යයට හසුකර ගැනීමයි.

## රාජ්‍ය වන්දනය (Cult of the state)

මුසෝලිනීගේ ෆැසිස්ට්වාදී අදහසේ සංකල්පගත කිරීමෙන් ඇරඹුණු මෙයින් කියැවුණේ රාජ්‍යයේ ආධිපත්‍යය මුළු සමාජයත්, සෑම පුරවැසියෙකුත්, කොන්දේසි සහ ප්‍රශ්න කිරීමකින් තොර ව පිළිගැනීමත්, රාජ්‍යයේ බලාධිකාරයට සිය කැමැත්තෙන් ම යටත් වීමත් ය.

ClassWork.LK

කුමක් නිසා ද යත්, රාජ්‍යයෙන් ප්‍රකාශ වන්නේ මුළු ජාතියේ ම ශ්‍රේෂ්ඨත්වය, ගෞරවය සහ ඉරණම නිසා ය.

ෆැසිස්ට් දේශපාලන ක්‍රමයෙහි රාජ්‍යයෙන් වෙන් වූ හා ස්වාධීන වූ පෞද්ගලික නිදහසක් නැත.

නිදහස සාක්ෂාත් වන්නේ බලයට, අධිකාරියට සහ නායකයාට යටත් වීම මඟිනි.

## පෞද්ගලික නිදහසක් නැත

ලිබරල් වාදයේ, මූලික හරය වූයේ රාජ්‍යයේ ආධිපත්‍යයෙන් ආරක්ෂා වන පෞද්ගලික නිදහස නම්, ෆැසිස්ට්වාදය යටතේ ''පෞද්ගලික නිදහස'' යන සංකල්පය ප්‍රතික්ෂේප විය.

පුද්ගලයකුගේ නිදහස පවතින්නේ රාජ්‍යයට, ජාතියට සහ නායකයාට කොන්දේසි විරහිතව අවනත වීමේ පරිමාව මත ය.

ClassWork.LK

## නායක වන්දනය (Cult of the leader)

නායකයාගේ බලය සහ ආධිපත්‍යයට සෑම පුරවැසියෙකුමත්, මුළු මහත් ජාතියත්, කොන්දේසි විරහිත ව සහ ස්වේච්ඡාවෙන් අවනත වීම. ෆැසිස්ට්වාදයේ විශේෂ ලක්ෂණයකි.

ජර්මනියේ නට්සිවාදය යටතේ ඉදිරියෙන් වූ ෆුරර් (Fuhrer) යන සංකල්පය මෙම නායක වන්දනය ප්‍රකාශ කළ ෆැසිස්ට්වාදී නිර්මාණයකි.

## අත්‍යන්ත වර්ගවාදය/ජාතිවාදය

ජර්මන් නට්සිවාදයෙහි වර්ධනය වූ මෙම ලක්ෂණය වෙතින් ප්‍රකාශ වූයේ ජර්මන් ජාතිය ලෝකයේ උතුම් ම වූ ජාතිය බවත්, ලෝකයේ ඉරණම රඳා පැවතියේ ජර්මන් ජාතියේ ඉරණම මත බවත්, එබැවින් මුළු ලෝකය මතම තම ආධිපත්‍යය පිහිටුවීමට ජාතියට ශුද්ධ වූ අයිතියක් තිබෙන බවත් ය.

''ජර්මන් ජාතිය ආර්ය ජාතියකි'' යන අදහස මේ වෙතින් පැන නැඟුණකි. ලක්ෂ සංඛ්‍යාත යුදෙව් ජාතිකයන් ඝාතනය කිරීම ජර්මන් නට්සිවාදීන් සාධාරණය කළේ මේ විශ්වාසය පදනම් කරගනිමිනි.

ClassWork.LK

## අත්‍යන්ත රණවාදය (extreme militarism)

අත්‍යන්ත රණවාදය මූලයන් දෙකක් වෙතින් පැන නැඟී ඇත.

- ජර්මන් ජාතිය ලෝකයේ ''උතුම්ම ජාතිය'' නිසා මුළු ලෝකයම තමන්ගේ යටතට ගැනීමේ ලෝක ව්‍යාප්තවාදී අදහස.
- ජර්මන් සමාජය ''ආර්ය'' ජර්මන් ජාතියේ බලයට තර්ජනයක් ලෙස සැලකූ අන්‍ය වාර්ගික කණ්ඩායම්වලින් ''නිදහස්'' කිරීම. දෙවන ලෝක යුද්ධය ආරම්භ කිරීමට ජර්මන් නට්සිවාදීන් පෙලඹුණෝ මෙම චින්තනය පදනම් කරගෙන ය.

ClassWork.LK

## ප්‍රචණ්ඩත්වය සහ භීෂණය (Terror) දේශපාලන බල මාධ්‍යයක් ලෙස භාවිත කිරීම

ෆැසිස්ට් රාජ්‍යයේත්, ෆැසිස්ට් බල ව්‍යාප්තියේත් විශේෂ ලක්ෂණය වූයේ මුළු සමාජය ම තමන්ගේ ආධිපත්‍යය යටතට බලහත්කාරයෙන් අත්කර ගැනීම යි.

තම බලයට එකඟ නොවන සෑම සමාජ/වාර්ගික කොටසක්ම යටත් කර ගැනීමට හා ශාරීරික ව විනාශ කිරීමට ෆැසිස්ට්වාදීහු සංවිධානාත්මක ව ඉදිරිපත් වූහ.

ඒ මත ''ජන සංහාරය'' (ඨැබදජසාැ) ෆැසිස්ට් රාජ්‍යයේ කාර්යයක් බවට පත් විය.

ෆැසිස්ට්වාදය සමඟ එකඟ නොවූ ජනයාට තිබුණේ විකල්ප දෙකකි. එක්කෝ රටහැර යාමයි. නැත්නම් ජනසංහාරයක ඝාතනයට ලක් වීම යි.

ClassWork.LK

පළමු ලෝක යුද්ධයෙන් පසු ව ඉතාලියේ සහ ජර්මනියේ පැන නැගුණු ෆැසිස්ට්වාදය, දෙවන ලෝක යුද්ධයේ දී එම රටවල් ලද පරාජයත් සමඟ නිල වශයෙන් අවසන් විය.

ෆැසිස්ට් වාදය මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ ඇති වූ මැකිය නොහැකි කළු පැල්ලමක් ලෙස සැලකේ.

ෆැසිස්ට් චින්තනය අද වන විට පරාජය වී ඇතත්, ඊට ඇදී ගිය (ආකර්ෂණය වූ) කුඩා කණ්ඩායම් යුරෝපයේත්, ඇමරිකාවේත් තවමත් සිටිති.

ClassWork.LK

ClassWork.LK